# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 2052/31 - 2018 ජනවාරි මස 05 වැනි සිකුරාදා - 2018.01.05

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනත (262 අධිකාරය)

76 අ වන වගන්තිය යටතේ නිකුත් කරන විධාන

1963 අංක 9, 1977 අංක 24, 1987 අංක 24, 1990 අංක 25 හා 2012 අංක 22 දරන පනත්වලින් සංශෝධිත 262 වන අධිකාරය වූ පළාත් පාලන ආයතන ඡන්ද විමසීම් ආඥාපනතේ විධිවිධානවලට අනුකූලව පවත්වනු ලැබීමට නියමිත 2018 පළාත් පාලන ආයතන ඡන්ද විමසීමේ දී තැපැල් ඡන්ද දායකයන්ට අදාළ ලියකියවිලි තැපෑලෙන් බෙද හැරීම, නිල ඡන්ද දැන්වීම් පත්‍රිකා තැපෑලෙන් බෙද හැරීම යන කාර්යයන් කිසියම් හේතුවක් නිසා අඩාල වන බව පෙනී යන්නේ නම්, එම කාර්යයන් මැතිවරණ කොමිෂන් සභාව විසින් යම් රාජ්‍ය ආයතනයක් මගින් හෝ රජයේ නිලධාරීන්ගේ හෝ ඒ වෙනුවෙන් මැතිවරණ කොමිෂන් සභාව විසින් යොදවා ගන්නා සේවකයන් මගින් හෝ වෙනත් විකල්ප ක්‍රියා මාර්ගයකින් හෝ ඉටු කරවා ගැනීම නීත්‍යානුකූල වන බවත් අවස්ථාවෝචිතව එම කාර්යයන් ඉටු කර ගැනීම පිණිස රජයේ යම් නිලධරයකුට කොමිෂන් සභාව විසින් කරනු ලබන දැනුම්දීමක් අනුව එම කාර්යයට සහය වීම එම නිලධරයාගේ වගකීම වන බවත් මෙයින් නිවේදනය කරනු ලැබේ.

මෙම විධාන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 104 ආ (2) ව්‍යවස්ථාවෙන් හා පෙර සඳහන් ආඥාපනතේ විධිවිධානවලින් මැතිවරණ කොමිෂන් සභාවට පැවරී ඇති බලතල අනුව නිකුත් කරනු ලැබේ.

මහින්ද දේශප්‍රිය,
සභාපති,
මැතිවරණ කොමිෂන් සභාව.

එන්. ජේ. අබේසේකර,
සාමාජික
මැතිවරණ කොමිෂන් සභාව.

එස්. රත්නජීවන් එච්. හූල්
සාමාජික,
මැතිවරණ කොමිෂන් සභාව.

2018 ක් වූ ජනවාරි මස 05 වැනි දින,
සරණ මාවත,
රාජගිරිය,
මැතිවරණ මහලේකම් කාර්යාලයේ දී ය.

01 - 703


1A - G 26925 — 57 (2018/01) ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.

*මෙම අති විශේෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*